මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022.01.24 |

# මහ බැංකුව, විදේශ විනිමයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන්ගෙන් ගෙවීම් භාර ගැනීම හෝටල් සේවා සැපයුම්කරුවන් වෙත අනිවාර්ය කරයි

ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන් සිදු කරන ගෙවීම් විදේශ විනිමයෙන් පමණක් භාර ගැනීමට හෝටල් සේවා සැපයුම්කරුවන්ට අනිවාර්ය කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් රීති නිකුත් කරන ලදී.

මෙම රීති 2022 ජනවාරි 21 දිනැති අංක 2263/41 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇත.

මෙම රීති නිකුත් කිරීමත් සමඟ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි බලපත්‍රලාභී හෝටල් සේවා සැපයුම්කරුවන් විසින්;

- ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන්ට සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් වන ගෙවීම් විදේශ විනිමයෙන් පමණක් භාර ගත යුතු ය.
- එවැනි විදේශ මුදල් හෝටල් සේවා සැපයුම්කරුගේ ව්‍යාපාරික විදේශ මුදල් ගිණුමකට බැර කිරීම හෝ බලපත්‍රලාභී බැංකුවකට විකිණීම ව්‍යාපාරික දින තුනක් ඇතුළත කළ යුතු ය.
- ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයින් විසින් විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් (ණයපත්, හරපත්, සංචාරක කාඩ්පත් යනා දී) හරහා සිදු කරන ගෙවීම් හෝටල් සේවා සැපයුම්කරුවාගේ ව්‍යාපාරික විදේශ මුදල් ගිණුමකට බැර කළ යුතු ය.

එසේ වුවත්, ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ මුදල් බලපත්‍රලාභී බැංකුවක් හෝ බලයලත් මුදල් හුවමාරුකරන්නෙකු හරහා ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලද බවට අදාල මුල් ලේඛන ලබා දිය හැකි නම්, හෝටල් සේවා සැපයුම්කරුවන්ට ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයින් විසින් ශ්‍රී ලංකා රුපියල් වලින් කරන ගෙවීම් භාර ගත හැක.